# වින්ඩෝස් මෙහෙයුම් පද්ධති තුල සිංහල භාෂාව ස්ථාපනය කරන ආකාරය

දේශීය භාෂා තාක්ෂණ සහාය මධ්‍යස්ථානය
info@helpcentre.lk
0117024957


# හැඳින්වීම

මෙහිදී මුලිකවම වින්ඩෝස් 10 මෙහෙයුම් පද්ධති තුල සිංහල භාෂාව ස්ථාපනය කරන  ආකාරය පිලිබඳවත්, සිංහල යුනිකේත අක්ෂර පරිගණකය තුල ස්ථාපනය කරන ආකාරය පිලිබඳවත් හදුන්වා දෙනු ලැබේ.

# වින්ඩෝස් 10 මෙහෙයුම් පද්ධති තුල සිංහල භාෂාව ස්ථාපනය කිරීම


## අවශ්‍ය පියවර

- පළමුව පරිගණකයේ සෙවුම් තීරුව තුල “*language settings*” යනුවෙන් සටහන් කරන්න. (රූප සටහන 1)





රූප සටහන 1

- ඉන්පසුව *“Language”* යටතේ තිබෙන *“Preferred languages”* හි *“Add a preferred language”* මත ක්ලික් කරන්න. (රූප සටහන 2)





රූප සටහන 2

- ඉන්පසුව *"Sinhala"* යනුවෙන් සඳහන් කර සෙවුම් කරන්න. පසුව එය තෝරාගෙන *"Next"* බොත්තම මත ක්ලික් කරන්න. (රූප සටහන 3)





රූප සටහන 3

- ඉන්පසුව රූප සටහනෙන් දැක්වෙන පරිදි “*Install*” ලෙස සඳහන් වන බොත්තම මත ක්ලික් කරන්න. (රූප සටහන 4)





රූප සටහන 4

- දැන් ඔබට සිංහල භාෂාව පරිගණකය තුල ස්ථාපනය වන ආකාරය දැක ගත හැකිය. (රූප සටහන 5)




රූප සටහන 5

- සිංහල භාෂාව ස්ථාපනය වූ පසුව, පරිගණකයේ කාර්ය තීරුව මත එය සඳහන්ව ඇති ආකාරය දැක ගත හැකිය. (රූප සටහන 6)





රූප සටහන 6

# සිංහල යුනිකේත අක්ෂර පරිගණකය තුල ස්ථාපනය කරන ආකාරය

- ඔබට සිංහල යුනිකේත අක්ෂර මෙම වෙබ් පිටුව මගින් භාගත කල හැකිය www.language.lk
- උදාහරණයක් ලෙස අපි BhashitaComplex  යුනිකේත අක්ෂර භාගත කරන ආකාරය බලමු.
- මේ සඳහා පහතින් දක්වා ඇති පියවර අනුගමනය කල හැකිය.


## අවශ්‍ය පියවර

- පහත  දැක්වෙන පරිදි භාගත කිරීම් යටතේ ඇති යුනිකෝඩ් අක්ෂර මත ක්ලික් කරන්න (රූප සටහන 1 ).




රූප සටහන 1

- ඉන්පසුව සිංහල අකුරු යටතේ ඇති භාෂිත අකුරු කුලකය මත ක්ලික් කරන්න. පසුව BhashitaComplex භාගත කිරීම මත ක්ලික් කරන්න (රූප සටහන 2 ).




රූප සටහන 2

- අදාල යුනිකේත අක්ෂර භාගත වීම අවසන් වූ පසුව, එම අක්ෂර ඔබගේ පරිගණකයට ස්ථාපනය කල හැකිය.
- දැන් ඔබට යුනිකේත අක්ෂර ඔබගේ පරිගණ තුල භාවිතා කල හැකිය.
- මෙම ආකාරය ඔබට අවශ්‍ය යුනිකේත අක්ෂර ඔබගේ පරිගණකය තුල ස්ථාපනය කල හැකිය

# දේශීය භාෂා තාක්ෂණ සහාය මධ්‍යස්ථානයෙන් සිංහල යුනිකෝඩ් සම්බන්ධව ඉදිරිපත් කර ඇති කෙටි වීඩියෝ

- වින්ඩෝස් 10 මෙහෙයුම් පද්ධතිය තුළ සිංහල යුනිකෝඩ් අකුරු ස්ථාපනය කරණ ආකාරය https://www.youtube.com/watch?v=9aOY-RGErGQ&t=2s

- වින්ඩෝස් 7 මෙහෙයුම් පද්ධතිය තුළ සිංහල යුනිකෝඩ් අකුරු ස්ථාපනය කරණ ආකාරය

  https://www.youtube.com/watch?v=q-To9GINLuM&t=6s

- එමෙන්ම අපගේ යූ ටියුබ් නාලිකාව හරහා සිංහල යුනිකෝඩ් භාවිතා කිරීමේදී ඇතිවන ගැටලු විසඳීමට අදාලව කෙටි වීඩියෝ කිහිපයක් ඇත.

- දේශීය භාෂා තාක්ෂණ සහාය මධ්‍යස්ථානයේ යූ ටියුබ් නාලිකාව - Local Language Technical Help Centre

  https://www.youtube.com/channel/UCR9nKvFZypuLSwHZLY8nUtA

ඔබ සැමට ස්තූතියි.